# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2021 අංක 22 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2021 ඔක්තෝබර් මස 13 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2021 ඔක්තෝබර් මස 15 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකි ය.

මිල : රු. 15.00

තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

2021 අංක 22 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2021 ඔක්තෝබර් මස 13 වන දින]

එල්.ඩී.—ඕ. 26/2018

1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 2021 අංක 22 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, 2022 පෙබරවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක විය යුතු ය. ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ 3 වන වගන්තියේ, "ජුනි මස පළමුවන දිනය," යන වචන වෙනුවට, "පෙබරවාරි මස පළමුවන දිනය" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. 1980 අංක 44 දරන පනතේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය පහත පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම

(අ) එහි (1) වන උපවගන්තියේ, "ජුනි මස පළමුවන දිනය," යන වචන වෙනුවට, "පෙබරවාරි මස පළමුවන දිනය" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) එහි (2) වන උපවගන්තියේ, "ජුනි මස පළමුවන දිනයේ දී" යන වචන වෙනුවට, "පෙබරවාරි මස පළමුවන දිනයේ දී" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ඇ) එහි (3) වන උපවගන්තියේ, "ජුනි මස පළමුවන දිනයේ දී," යන වචන වෙනුවට, "පෙබරවාරි මස පළමුවන දිනයේ දී" යන වචන ආදේශ කිරීමෙන්.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ, "ජුනි මාසයේ පළමුවන දිනයෙහි," යන වචන වෙනුවට, "පෙබරවාරි මාසයේ පළමුවන දිනයෙහි" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කිරීම

ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "ජනවාරි මස තිස් එක් වන දින" යන වචන වෙනුවට "සැප්තැම්බර් මස තිස් වන දින" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 20අ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එම වගන්තිය, ප්‍රධාන ප්‍රඥප්තියේ 20අ වන වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය:—

"සුදුසුකම ලැබීමේ විවිධ දින හා පරිපූරක ලැයිස්තු

20අ. (1) 3 වන වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද-

(අ) යම් වර්ෂයක පෙබරවාරි මස පළමුවන දිනෙන් ආරම්භ වී එම වර්ෂයේ ම මැයි මස තිස්එක්වන දිනෙන් අවසන් වන්නා වූ කාලසීමාව ඇතුළත;

(ආ) යම් වර්ෂයක ජුනි මස පළමුවන දිනෙන් ආරම්භ වී එම වර්ෂයේ ම සැප්තැම්බර් මස තිස්වන දිනෙන් අවසන් වන්නා වූ කාලසීමාව ඇතුළත; සහ

(ඇ) යම් වර්ෂයක ඔක්තෝබර් මස පළමුවන දිනෙන් ආරම්භ වී පසුව එළඹෙන වර්ෂයේ ජනවාරි මස තිස්එක්වන දිනෙන් අවසන් වන්නා වූ කාලසීමාව ඇතුළත,

අටළොස් විය සම්පූර්ණ කරන යම් තැනැත්තකු, ඡන්ද හිමියකු ලෙස නාමලේඛනයක තමාගේ නම ඇතුළත් කරවා ගැනීමට හෝ තබා ගැනීමට හෝ සුදුසුකම් ලැබිය යුතු ය.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ඡන්ද හිමියකු ලෙස ලියාපදිංචි වීමට සුදුසුකම්ලත් සෑම තැනැත්තකු විසින් ම ඡන්ද හිමියකු ලෙස ලියාපදිංචි වීම සඳහා 4 වන වගන්තියේ (2) වන උපවගන්තිය ප්‍රකාරව එම තැනැත්තාගේ සුදුසුකම් ලැබීමේ ලිපිනය පිහිටා ඇති මැතිවරණ කොට්ඨාසයේ ලියාපදිංචි කිරීමේ නිලධරයා වෙත ඉල්ලුම් කළ හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ ඡන්ද හිමියකු ලෙස ලියාපදිංචි වීමට සුදුසුකම් ලත් සෑම තැනැත්තකු විසින්ම පහත දැක්වෙන ලේඛන ද සමග එම ඉල්ලීම 4 වන වගන්තියේ (2) වන උපවගන්තිය ප්‍රකාරව එම තැනැත්තාගේ සුදුසුකම් ලැබීමේ ලිපිනය පිහිටා ඇති මැතිවරණ කොට්ඨාසයේ ලියාපදිංචි කිරීමේ නිලධරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය:—

(අ) එම තැනැත්තාගේ උප්පැන්න සහතිකයේ පිටපතක්; හෝ

(ආ) එම තැනැත්තාගේ ජාතික හැඳුනුම්පතේ පිටපතක්.

(4) මැතිවරණ කොට්ඨාසයක සෑම ලියාපදිංචි කිරීමේ නිලධරයකු විසින් ම —

(අ) යම් වර්ෂයක පෙබරවාරි මස පළමුවන දින සහ එම වර්ෂයේ ම මැයි මස තිස්එක්වන දින අතර කාලයේ දී අටළොස් විය සම්පූර්ණ කර ඇති ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කර ඇති සියලු තැනැත්තන්;

(ආ) යම් වර්ෂයක ජුනි මස පළමුවන දින සහ එම වර්ෂයේ ම සැප්තැම්බර් මස තිස්වන දින අතර කාලයේ දී අටළොස් විය සම්පූර්ණ කර ඇති ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කර ඇති සියලු තැනැත්තන්; සහ

(ඇ) යම් වර්ෂයක ඔක්තෝබර් මස පළමුවන දින සහ පසුව එළඹෙන වර්ෂයේ ජනවාරි මස තිස්එක්වන දින අතර කාලයේ දී අටළොස් විය සම්පූර්ණ කර ඇති ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කර ඇති සියලු තැනැත්තන්,

සම්බන්ධයෙන් පිළිවෙළින් පරිපූරක ලැයිස්තු සකස් කළ යුතු ය.

(5) එක් එක් මැතිවරණ කොට්ඨාසවල සෑම ලියාපදිංචි කිරීමේ නිලධරයකු විසින් ම, සති දෙකක කාලසීමාවක් ඇතුළත, (4) වන උපවගන්තියේ සඳහන් කරනු ලබන අදාළ පරිපූරක ලැයිස්තු සම්පූර්ණ කර ඇති බව හා එකී පරිපූරක ලැයිස්තු හෝ ඒවායෙහි පිටපත් ලියාපදිංචි කිරීමේ නිලධරයාගේ කාර්යාලයේ දී හෝ දැන්වීමේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි මැතිවරණ කොට්ඨාසය තුළ එවැනි වෙනත් ස්ථානයක දී දවසේ සියලු යුක්ති සහගත වේලාවන් තුළ පරීක්ෂා කිරීමට හැකි බව දන්වමින් දැන්වීමක් පළ කරනු ලැබිය යුතු ය. එකී සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එම දැන්වීම් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන එක් එක් භාෂාවලින් පළවන යටත් පිරිසෙයින් එක් ප්‍රවෘත්ති පත්‍රයක හෝ පළ කරනු ලැබිය යුතු ය.

(6) මේ වගන්තිය යටතේ සකස් කරන ලද පරිපූරක ලැයිස්තුවක තමාගේ නම ඇතුළත් කරවා ගැනීමට අයිතිය කියා සිටින සෑම තැනැත්තකු විසින් ම, එම ලැයිස්තුවේ තමාගේ නම ඇතුළත් කරවා ගැනීම සඳහා මැතිවරණ කොට්ඨාසයේ ලියාපදිංචි කිරීමේ නිලධරයා වෙත ඉල්ලීමක් කළ හැකි ය. එවැනි සෑම ඉල්ලීමක් ම පරිපූරක ලැයිස්තුවට අදාළ දැන්වීම පළ කරනු ලැබූ දින සිට දින දහයක් ඇතුළත කරනු ලැබිය යුතු ය.

(7) මේ වගන්තිය යටතේ සකස් කරන ලද පරිපූරක ලැයිස්තුවක යම් තැනැත්තකුගේ නම ඇතුළත් කිරීම සම්බන්ධයෙන් ලියාපදිංචි ඡන්ද හිමියකු විසින්, විරෝධය පෑම කරනු ලැබිය හැකි අතර, එකී සෑම විරෝධය පෑමක් ම එම පරිපූරක ලැයිස්තුවට අදාළ දැන්වීම පළ කරනු ලැබූ දින සිට දින දහයක් ඇතුළත මැතිවරණ කොට්ඨාසයේ ලියාපදිංචි කිරීමේ නිලධරයා වෙත ලිඛිතව ඉදිරිපත් කළ යුතු ය.

(8) හිමිකම්පෑම් හා විරෝධයපෑම් පිළිබඳව තීරණය කිරීම සඳහා මේ පනතේ අදාළ වන යම් විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව මේ වගන්තිය යටතේ වන යම් හිමිකම්පෑම් සහ විරෝධයපෑම් සඳහා අදාළ විය යුතු ය.

(9) හිමිකම්පෑම් හා විරෝධයපෑම් නිශ්චය කරනු ලැබීමෙන් ඉක්බිතිව ම එක් එක් මැතිවරණ කොට්ඨාසයෙහි ලියාපදිංචි කිරීමේ නිලධරයා විසින් මේ වගන්තිය යටතේ ඔහු විසින් සකස් කරන ලද පරිපූරක ලැයිස්තු සහතික කළ යුතු ය. එසේ සහතික කිරීමෙන් පසු, එම ලැයිස්තු සහතික කරන ලද පරිපූරක නාමලේඛනය ලෙස හඳුන්වනු ලැබිය යුතු අතර, එය එම මැතිවරණ කොට්ඨාසය සඳහා වූ මැතිවරණ නාමලේඛනයට ඇමුණුමක් ලෙස අමුණනු ලැබිය යුතු ය.

(10) 20අ වන වගන්තියේ (9) වන උපවගන්තිය යටතේ යම් පරිපූරක නාමලේඛනයක් සහතික කරනු ලැබූ විට ලියාපදිංචි කිරීමේ නිලධරයා විසින් එම නාමලේඛනය සහතික කරනු ලැබූ බවට ගැසට් පත්‍රයෙහි සහ එක් එක් ජාතික භාෂාවෙන් වූ යටත් පිරිසෙයින් එක් ප්‍රවෘත්ති පත්‍රයක හෝ දැන්වීමක් පළකිරීමෙන් එම නාමලේඛනය සහතික කර ඇති බව දැනුම් දිය යුතු ය.

(11) යම් මැතිවරණ කොට්ඨාසයක් සඳහා වූ සහතික කරන ලද පරිපූරක නාමලේඛනය, 10 වන උපවගන්තියේ සඳහන් නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දිනයේ දී බලාත්මක විය යුතු අතර, 15 වන වගන්තියේ (4) වන උපවගන්තිය හෝ 18 වන වගන්තිය අනුව පසු කාලයක දී කරනු ලැබිය හැකි යම් වෙනස් කිරීම් වුවහොත්, ඒවාට යටත්ව සහතික කරන ලද ඊළඟ නාමලේඛනය බලාත්මක වීමෙන් නිෂ්ප්‍රභා වනතෙක් එම සහතික කරන ලද පරිපූරක ලේඛනය තවදුරටත් බලාත්මකව පැවතිය යුතු ය.".

24අ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එය එම පනතේ 24අ වන වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:—

"විධාන නිකුත් කිරීමට මැතිවරණ කොමිෂන් සභාව සතු බලතල

24අ. මැතිවරණ කොමිෂන් සභාව විසින් ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනතට අදාළව යම් දුෂ්කරතාවයක් හෝ කලින් අපේක්ෂා නොකළ කරුණු පිළිබඳව තීරණය කිරීම හෝ වෙනස් කිරීමක් සිදු කිරීම සඳහා හෝ යම් ප්‍රශ්නයක් හෝ කාරණයක් තීරණය කිරීම හෝ වෙනස් කිරීම සඳහා අවශ්‍ය යයි සලකනු ලබන විධාන නිකුත් කළ හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය සංශෝධනය කිරීම

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තියේ "ඡන්ද හිමි නාමලේඛනය" යන යෙදුමේ අර්ථ නිරූපණයෙහි "යම් මැතිවරණ කොට්ඨාසයක් සඳහා" යන වචන වෙනුවට "20අ වන වගන්තිය යටතේ සකස් කරන ලද සහතික කරන ලද පරිපූරක නාමලේඛනය ඇතුළුව යම් මැතිවරණ කොට්ඨාසයක් සඳහා" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය සංශෝධනය කිරීම

9. ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) උපලේඛනයේ "අ" වන ආකෘතියෙහි (2) වන, (3) වන සහ (5) (ii) වන අයිතමයන්හි "19.... ක් වූ ජූනි මස 1 වන දින" යන වචන සහ අංක වෙනුවට "20... ක් වූ පෙබරවාරි මස 1 වන දින" යන වචන සහ අංක ආදේශ කිරීමෙන්; සහ

(2) උපලේඛනයේ "ආ" වන ආකෘතියෙහි (2) වන, (3) වන සහ (5) (ii) වන අයිතමයන්හි "19.... ක් වූ ජූනි මස 1 වන දින" යන වචන සහ අංක වෙනුවට "20... ක් වූ පෙබරවාරි මස 1 වන දින" යන වචන සහ අංක ආදේශ කිරීමෙන්.

නිශ්චිත කාලසීමාවක් සඳහා වූ පරිපූරක ලැයිස්තුව

10. (1) 3 වන වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, 2021 ජූනි මස පළමුවන දින සිට මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දින දක්වා වන කාලසීමාව ඇතුළත යම් දිනයක දී වයස අවුරුදු දහඅටට එළඹෙන්නා වූ යම් තැනැත්තකු, ඡන්ද හිමියකු වශයෙන් ඡන්ද හිමි නාමලේඛනයේ එකී තැනැත්තාගේ නම ඇතුළත්

කරවා ගැනීමට හෝ තබා ගැනීමට සුදුසුකම් ලැබිය යුතු අතර, එවැනි සෑම තැනැත්තකු විසින් ම 20අ වන වගන්තියේ (3) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති ලේඛන ද සමග එම තැනැත්තාගේ සුදුසුකම් ලැබීමේ ලිපිනය පිහිටා ඇති මැතිවරණ කොට්ඨාසයේ ලියාපදිංචි කිරීමේ නිලධරයා වෙත ඉල්ලුම් කරනු ලැබිය යුතු ය.

(2) සෑම ලියාපදිංචි කිරීමේ නිලධරයකු විසින් ම, (1) වන උපවගන්තියේ සඳහන් වන කාර්යය සඳහා පරිපූරක ලැයිස්තුවක් සකස් කරනු ලැබිය යුතු අතර එම පරිපූරක ලැයිස්තුව සකස් කිරීම සඳහා 20අ වන වගන්තියේ (5) සිට (11) දක්වා වන උපවගන්තිවල නිශ්චිතව දක්වා ඇති කාර්ය පටිපාටිය අවශ්‍ය වෙනස්කම් සහිතව අදාළ කරගනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

11. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.